"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 2698409
ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி / General Telephone 2682868, 2682869, 2682870

මගේ අංකය. / எனது இல. / My No. CSO/FIN/2/3/19

ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2018.02. 26

# මූල්‍ය චක්‍රලේඛ 06/2018

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.),

## රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය
## රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම.

2017 ජුනි 28 දින නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017, 2017.09.08 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 04/2017 මගින් බස්නාහිර පළාතට අදාල කර ගෙන ඇත.

02. චක්‍රලේඛ අංක 01/2017 යටතේ රජය විසින් ලබා ගත් තොරතුරු අනුව වාහන භාවිතය සම්බන්ධයෙන් රජයේ ආයතනවලට අදාල වන පොදු කරුණක් ලෙස වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳව ගැටළු පවතින බව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017.12.21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 මගින් පෙන්වා දී ඇත.

03. ඒ අනුව වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 යම් සංශෝධනයන්ට යටත්ව පළාතට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව පහත පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි ප්‍රධාන අරමුණ වන්නේ රජයේ මූල්‍ය නොවන වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට අවශ්‍ය වන මූලික පදනම සකස් කිරීමයි.ඒ අනුව, පළාත් සභාවේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන පළාත් සභාවට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින්ම ලියාපදිංචි කර තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. ඒ සඳහා, වාහන අයිතිය පිළිබඳ පවතින ගැටළු 2018 ජුනි 30 දිනට ප්‍රථම නිරාකරණය කර ගැනීම සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කල යුතු අතර මෝටර්රථ ප්‍රවාහන පණතේ විධිවිධාන වලට අනුකූලව අවශ්‍ය කටයුතු කල යුතුය.

i. ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත, තම ආයතනයේ නමින් ලියාපදිංචි කර ගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කල යුතුය.

ii. පරිහරණය කරන ලබන නමුත්, දැනටමත් අහෝසි වී ඇති අමාත්‍යාංශ/ආයතන නමින් වාහනවල ලියාපදිංචි අයිතිය ඇති විටක අදාල කාර්යය හා කර්තව්‍යයන් පැවරී ඇති නව අමාත්‍යාංශ/ආයතන වලට අදාල වාහන පැවරීමට හෝ අදාල ගැසට් නිවේදනයේ සඳහන් ක්‍රියාමාර්ග හෝ අදාල වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ විධිවිධාන අනුව පවරා ගැනීමට කටයුතු කල යුතුය.

iii. පළාත් සභාවේ ආයතනවලට පරිත්‍යාග වශයෙන් ලැබී ඇති වාහන සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආනයනය කර ඇති වාහන භාවිතය සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය.

අ) භාවිතය ආර්ථිකමය වශයෙන් ඵලදායීවන්නේ නම් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත අදාල බදු මුදල් ගෙවා එම වාහනවල ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුව ඇත. ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝජනයෙන් යුත් කමිටුවක් මඟින් මා වෙත නිර්දේශ ඉදිරිපත් කල යුතු අතර, එම බදු මුදල් ගෙවා වාහනයේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

ආ) ඉහත (අ) යටතේ ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට නොහැකිවන හෝ ඵලදායී නොවන වාහන පිළිබඳ තොරතුරු අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝජනයෙන් යුත් කමිටුවක් මඟින් නිර්දේශ කර ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත ඉදිරිපත් කල යුතුය.

iv. රාජ්‍ය ව්‍යවසාය සඳහා වන මාර්ගෝපදේශයේ 8.3.9 වගන්තිය යටතේ දැනටමත් උපදෙස් දී ඇති පරිදි පළාත් සභා ව්‍යවස්ථාපිත ආයතනවල අරමුදලින් මිලදී ගත් වාහන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් භාවිතා නොකල යුතුය.

05. මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ගෙන් විමසිය හැකිය.

06. පළාත් සභාවේ වත්කම් කළමනාකරණය පළාත් නිලධාරීන් විසින් ඉටු කල යුතු ප්‍රමුඛ කාර්යයක් වන බැවින් ඉහත සඳහන් උපදෙස් අනුගමනය කරන ලෙස සියලුම බස්නාහිර පළාත් සභාවේ ආයතන වෙත වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: 01. විගණකාධිපති.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක)
03. තොරතුරු තාක්ෂණ නිලධාරී.